www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# මුලෝපායිකව වැදගත්, පකිස්ථාන් චීන ආර්ථික බිම් තීරුවේ චීනය ඩොලර් බිලියන 46 ක් ආයෝජනය කරයි

## China invests $46 billion in strategic Pakistan-China Economic Corridor

**අදියන් සිල්වා විසිනි**
**2015 අප්‍රේල් 28**

චීන ජනපති සී ජින්පෙන්ග් අප්‍රේල් 20 වෙනි දා, ආයෝජකයන්, බැංකුකරුවන් හා ව්‍යාපාරිකයන් සමග පකිස්ථානයට පැමිනියේ පකිස්ථාන්-චීන ආර්ථික බිම් තීරු ව්‍යාපෘතිය ආරම්භ කිරීම සඳහා ය. මෙම ව්‍යාපෘතිය මගින් චීනයට මැදපෙරදිග රටවල සිට පෙට්‍රෝලියම් වැනි බලශක්ති සම්පත් පකිස්ථානය හරහා වූ ගොඩබිම් මාර්ගයක් ඔස්සේ චීනය වෙත ප්‍රවාහනය කිරීමට හැකියාව ලැබේ.

චීනය හුදකලා කර මැඬීමට සැලසුම් කරනු ලැබූ ඔබාමා පාලනයේ "ආසියාවට හැරීම" තුලින් මිලිටරි ආතතීන් උත්සන්න කිරීම් මධ්‍යයේ මෙම ගිවිසුම විශේෂයෙන්ම වැදගත් වේ. මෙතුලින්, එක්සත් ජනපද හා එහි සහචර නාවික හමුදා මැදපෙරදිගින් චීනයට කරන බලශක්ති ආනයනය වැලැක්වීමේ තර්ජනය විශාල වශයෙන් මගහැරිය හැකිය.

චීනය ලෝකයේ විශාලතම තෙල් ආනයනකරුය. එහි තෙල් අවශ්‍යතාවන්ගෙන් සියයට 60 මැද පෙරදිගින් ආනයනය කරන අතර, ප්‍රවාහනයෙන් සියයට 80 ඉන්දියානු සාගරයේ මැලැක්කා සමුද්‍ර සන්ධිය ද දකුනු හා නැගෙනහිර චීන මුහුදු හරහා ද සිදුකරයි.

මෙම ආර්ථික ව්‍යාපෘතියේ කොටසක් ලෙස චීනය, ඩොලර් බිලියන 46ක් වන අවබෝධතා ගිවිසුම් 51 පකිස්ථානය සමග අත්සන් කලේ ය. සීමාසහිත චීන කර්මාන්ත හා වානිජ බැංකුව, එක්සිම් බැංකුව හා චීන සංවර්ධන බැංකු සංස්ථාව වැනි චීන බැංකු මගින් මේවාට මුදල් සැපයීමට නියමිතය.

පකිස්ථානයේ ප්‍රධානතම අවි සපයන්නා ලෙස චීනය යුආන් පංතියේ 039A හෝ 041 වර්ගයේ ඩීසල් බලයෙන් ක්‍රියා කරන ප්‍රහාරක සබ්මැරීන 8 ක් පකිස්ථානයට සැපයීමට නියමිතය. පකිස්ථාන අගමැති නවාස් ෂෙරිෆ් හා ආරක්ෂක මන්ඩලය ගනුදෙනුව අනුමත කර ඇත. එය පකිස්ථාන සබ්මැරින් සේනාංකය නවීකරනය කර එයට න්‍යෂ්ටික මිසයිල හැකියාව ලාබාදීම සඳහා වන පුලුල් ව්‍යායාමයේ කොටසකි.

මෙම බිම් තීරු ව්‍යාපෘතිය පකිස්ථානයේ ගවදාර් වරායේ තෙල් ගබඩා පහසුකම් හා පකිස්ථානය හරහා ගවදාර් සිට බටහිර චීනයේ කස්ගාර් කඳු වැටි සහිත පකිස්ථාන් චීන දේශසීමාව හරහා කෙලින්ම දිව යන කිලෝමීටර 3000 ක් වූ නල මාර්ග, දුම්රිය මාර්ග සහ මහාමාර්ග ජාලයකින් ද සමන්විත වේ. එයට ගුවන් ප්‍රවාහන, දුම්රිය යටිතල පහසුකම් සුලං හා ජලවිදුලිබල හා ෆයිබර් තන්තු සංනිවේදනය පිලිබඳ තාක්ෂනික සහයෝගිතාවය ද ඇතුලත් වේ.

ගවදාර් මුලෝපායිකව පිහිටා ඇත්තේ බලුකිස්තානයේ අරාබි මුහුදු තීරයේය. එය පකිස්ථානයේ දුප්පත් ම හා වඩාත් ම අස්ථාවර ප්‍රාන්තයකි. එය තෙල් සම්පත් සහිත ගල්ෆ් කලාපයට හා හෝර්මුස් සමුද්‍ර සන්ධියට මායිම් ව පිහිටා ඇත. ගල්ෆ් කලාපයේ සිට කරන තෙල් අපනයනය, ආසන්න වශයෙන් ලෝකයේ තෙල් වෙලඳාමෙන් සියයට 40 හිමිකම් කියන හෝර්මුස් සමුද්‍ර සන්ධිය හරහා අනිවාර්යෙන් ම ගමන් කලයුතුය. ගිවිසුමේ කොන්දේසිවලට අනුව, චීන වරාය ඉංජිනේරු සමාගම ඉදිකිරීම් ආරම්භ කිරීමත් සමග මේ අවුරුද්දේ මුල සිට ගවදාර් වාරය අවුරුදු 40 කට චීනය වෙත පැවරුනි.

කස්ගාර්, වයඹදිග චීනයේ පිහිටා ඇති සින්ජියන් උයිගර් ප්‍රදේශයේ ඇති ප්‍රධාන නගරයකි. මෙම අභ්‍යන්තර ප්‍රදේශය චීනයේ පැසිෆික් මුහුදු තීරයේ ඇති කාර්ය බහුල අපනයන මධ්‍යස්ථාන වලට වඩා දුප්පත් වන අතර උයිගර් හා ප්‍රධානතම ජන කොටස වන හන් චීන ජාතිකයින් අතර වාර්ගික ආතතීන් උග්‍රවෙමින් ඇත. චීන ආන්ඩුව පුනපුනා ප්‍රකාශකර ඇත්තේ සින්ජියන් හි ආර්ථික වර්ධනය දේශපාලන ප්‍රමුඛතාවක් ලෙස සලකන බවයි.

යෝජිත ආර්ථික බිම් තීරය, චීනය හා මැද පෙරදිග අතර වෙලඳ භාන්ඩ ප්‍රවාහනයට ඇති දුරෙන් කිලෝමීටර් 16,000ක් අඩුකරන නව වෙලඳ මාර්ගයක් විවෘත කරයි.

කෙසේ වෙතත්, ගනුදෙනුව ගෝලීය ධනවාදය පතුලේ ඇති ප්‍රතිවිරෝධයන් දෙසට යොමු වෙයි: මධ්‍යම ආසියාව ආර්ථික වශයෙන් දියුනු කිරීමට යාම අධිරාජ්‍යවාදී හා කාලාපීය බලයන් අතර මිලිටරිමය ආතතීන් අවුලුවාලයි. එනමුත් මෙම නොදියුනු ප්‍රදේශවල වාසය කරන බිලියන ගනනාවක් වූ ජනතාව තවමත් උග්‍ර දරිද්‍රතාවයෙන් හා සමාජ පසුගාමිත්වයෙන් පීඩාවිඳියි. මොවුන් දැනටමත් න්‍යෂ්ටික

අවි බලවතුන් වන පාකිස්ථානය, ඉන්දියාව චීනය හා එක්සත් ජනපදය අතර ඇතිවිය හැකි ගැටුමක අවදානමට මුහුන පා සිටියි.

සියල්ලටමත් වඩා මෙම ආතතීන් වර්ධනය වීමට මූලික වන්නේ, ඇමරිකානු අධිරාජ්‍යවාදයේ ආක්‍රමනකාරී "ආසියාවට හැරීමය". එක්සත් ජනපදය චීනය වැටලීමේ මූලෝපාය වෙනුවෙන් ඉන්දියාව, ජපානය, ඕස්ට්‍රේලියාව, වියට්නාම්, පිලිපීනය හා සිංගප්පූරුව සමග සන්ධාන ගතවී ඇත. එක්සත් ජනපද, යුරෝපීය හා ආසියානු නාවික හමුදාවන් එකාබද්ධව ඉන්දියානු හා පැසිෆික් සාගරයේ චීන තෙල් සැපයුම් අඩාල කිරීමක් සංවිධානය කිරීමේ තර්ජනය මෙම වැඩ සටහනේ ප්‍රධාන අංගයක් වේ.

චීන පකිස්තාන ගනුදෙනුව වොෂින්ටනයට දේශපාලනික අතුල් පහරකි. වොෂින්ටනය පකිස්ථානයේ අසල්වැසියා වන ඇෆ්ගනිස්ථානයේ තම හමුදා ඉවත් කරගනිමින් සිටින අතරම කලාපය තුල දැඩි අප්‍රසාදයකට ලක්වී ඇත. සී.අයි.ඒ ඩ්‍රෝන් ප්‍රහාර හේතුවෙන් 2004 සිට පකිස්ථානයේ දහස් ගනනක් අහිංසක මිනිසුන් මිය ගොස් ඇත. ඔබාමා පාලනය යටතේ ප්‍රහාරයන් 330 සිදු කර ඇත. එක්සත් ජාතීන්ගේ නිලධාරින්, පකිස්ථාන අධිකරනය හා ජාත්‍යන්තර ක්ෂමා සංවිධානය වැනි මානව හිමිකම් කන්ඩායම් ඩ්‍රෝන් ප්‍රහාර නීතිවිරෝධී බව ප්‍රකාශ කරන නමුත් සී.අයි.ඒ සංවිධානය පකිස්ථානයේ ඇති පැතිරුන විරුද්ධත්වය පාගා දමමින් දිගටම ඒවා ක්‍රියාවට නංවයි.

පකිස්ථානයේ ඇති බෙයිජිනයේ කාර්මික ආයෝජන ඇමරිකානු අධිරාජ්‍යවාදයේ විනාශකාරී භූමිකාවට ප්‍රතිවිරුද්ධ වේ. ඇමරිකානු අධිරාජ්‍යවාදය සතු විශාල මූල්‍ය සම්පත්වල ශක්තිය යොදවන්නේ බෝම්බ දැමීමට හා කලාපයේ ජනතාව භීතියට පත් කිරීමටය.

චීනයේ ඩොලර් බිලියන් 46 ආයෝජනය, පකිස්ථානයට පසුගිය සත් වසරක කාලය තුල ලැබුනු සෘජු විදේශ ආයෝජනයන් හා එක්සත් ජනපදය පකිස්ථානය සඳහා කරන වියදමට වඩා වැඩිය. 2002 සිට වොෂින්ටනය ඩොලර් බිලියන 31 පකිස්ථානයට ලබා දී ඇති අතර එයින් තුනෙන් දෙකක් "ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය" සඳහා කැප කර ඇත.

අප්‍රේල් 19 දා *නිව්යෝර්ක් ටයිම්ස්* පත්‍රය වාර්තා කර තිබුනේ, "මෙම ප්‍රයත්නය 'මහා පරාජයක්' බවයි. මක් නිසාද යත් සම්පත් තුනී ආකාරයට විසිරී ඇති හෙයින් කිසිදු ප්‍රායෝගික හා මූලෝපායික බලපෑමක් සිදු නොකරන බවය. එසේ පවසා තිබුනේ පෙනටගනයේ එම කාලයේ පකිස්ථානය පිලිබඳ වගකීම් දැරූ හිටපු ජ්‍යෙෂ්ට නිලධාරි ඩේවිඩ් සෙඩ්නි ය.

අනිකුත් කලාපීය බලවතුන්, සියල්ලටත් වඩා 1962 දී චීනයත් සමග යුද වැදුනු පකිස්ථානයේ සාම්ප්‍රදායික සතුරා වන ඉන්දියාව, සැලකිලිමත්ව තත්වය විමර්ශනය කරමින් සිටින්නේ නවතම චීන පකිස්ථානු ගනුදෙනුවේ මිලිටරිමය ඇඟවුම් හා එයට ප්‍රතිවිරුද්ධ මූලෝපායන් සැකසීම ගැනය.

ජින්පෙන්ග් පකිස්ථානයේ සංචාරය කිරීමට දවසකට පෙර, ඉන්දියානු නාවික හමුදාපති අද්මිරාල් රොබින් ධෝවාන් *හින්දුස්ථාන් ටයිම්ස්* සමග සම්මුඛ සාකච්චාවකට එක්වෙමින් අවධාරනාත්මකව කියා සිටියේ, "නාවික හමුදාව ඔනෑම අනපේක්ෂිත සිදුවීමකට සූදානම් බව හා ඉන්දියානු සාගරය ම දැඩි නිරීක්ෂනයකට යටත් කර ඇති බවය. එය අප අවට ඇති වැදගත් ජල තීරයන් පිලිබඳව දැඩි අවදානයකින් පසුවෙයි. නාවික හමුදාව බහුකාර්ය බලකායක් වන අතර අප මුහුදේ පාලනය පිලිබඳ සියලු අංශයන් පිලිබඳ සැලකිලිමත් වන අතර කාලාපයේ ඇතිවෙන වර්ධනයන් හමුවේ මුහුදට ඇතුලුවීම වැලැක්වීමට කටයුතු කරයි." යනුවෙනි.

මෙම මස මුලදී ඉන්දියානු අගමැති නරේන්ද්‍ර මෝඩි ප්‍රන්සයට ගිය අතර එහිදී ඉන්දියානු ගුවන් හමුදව නවීකරනය කිරීම සඳහා රෆායෙල් ජෙට් යනා දුසිම් ගනනක් මිලට ගැනීම ගැන හා ඊපීආර් න්‍යෂ්ටික ප්‍රතික්‍රියාකාරක මිලදී ගැනීම පිලිබඳව සාකච්චා කලේය.

ඔවුන් ගිවිසුම්ගතව ඉදිරියට යන විට, චීන හා පකිස්ථාන තන්ත්‍රයන්ට පාකිස්ථානු ධනපති පාලනය තුල වර්ධනය වී ඇති බලූකිස්තානයේ සමජ හා වාර්ගික ගැටුම්වලට මුහුන පෑමට සිදුවේ.

ජනපති සී ජින්පෙන්ග් පාකිස්ථාන හමුදාවේ මාන්ඩලික ප්‍රධානි හා හමුදාවන්හි ප්‍රධානියා හමුවුයේ ආරක්ෂක ව්‍යපෘති පිලිබඳ සාකච්චා කිරීමට ය. දසදහසක නව විශේෂ හමුදා භටකායක් පකිස්ථානයේ සිටින චීන ඉදිකිරීම් කම්කරුවන් ආරක්ෂා කිරීමට යොදන බවට පකිස්ථානු අගමැති නවාස් ෂෙරිෆ් ඇතුලු පකිස්ථානු නිලධාරීන් පොරොන්දු වූයේය. ජනාධිපති ජින්පෙන්ග් ඉස්ලාමාබාද්හිදී විවිධ දේශපාලන පක්ෂවල නායකයන් හමුවූයේ මෙම ව්‍යාපෘතිය ගැන සාකච්චා කිරීමට ය.

අප්‍රේල් 11 දා, බලූකිස්තානයේ ටුර්බට් ආසන්නයේදී, සින්ධි හා පන්ජාබි ඉදිකිරීම් කම්කරුවන් 20 දෙනෙකු ඝාතනය කරනු ලැබිනි. බෙදුම්වාදී බලොක් විමුක්ති පෙරමුන මෙම ප්‍රහාරය පිලිබඳ වගකීම බාරගත්තේය.

© www.wsws.org